Prepared by- එච්. ආර්. ප්‍රදීප් කුමාර

# ව්‍යාපාර පසුබිම

01. වර්තමාන සමාජයේ පැවැත්මට මෙන්ම සංවර්ධනයටද ව්‍යාපර අත්‍යවශ්‍ය සාධකයක් වී ඇත. ඒ අනුව ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල දැකිය හැකි අරමුණු 4 ක් ලියන්න.
02. මිනිස් අවශ්‍යතා 4 ක් සඳහන් කරන්න.
03. එම අවශ්‍යතා සපුරාගන්නා ආකාර සඳහන් කරන්න.
04. මිනිස් අවශ්‍යතාවල දැකිය හැකි ලක්ෂණ 4 ක් ලියන්න.
05. මිනිස් වුවමනාවල දැකිය හැකි ලක්ෂණ 4 ක් ලියන්න.
06. මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර දක්නට ලැබෙන වෙනස්කම් 4 ක් ලියන්න.
07. භාණ්ඩ සම්බන්ධයෙන් පැවතිය හැකි ලක්ෂණ 2 ක් ද, සේවා සම්බන්ධයෙන් පැවතිය ලක්ෂණ 2 ක් ද සඳහන් කරන්න.
08. නිෂ්පාදන සාධක 2 ක් උදාහරණ සහිතව නම් කරන්න.
09. හිස්තැන් පුරවන්න
    I. නිෂ්පාදනයේ දී අධාර කරගන්නා මිනිසා විසින් සකස් කරන ලද දෑ ............................ වේ.
    II. ව්‍යාපාර අවධානම් දරමින් නව්‍යතා සම්පාදනය කරමින් ව්‍යාපාර කටයුතු පිළිබඳ තීරණ ගන්නා පුද්ගලයා .......................... ලෙස හඳුන්වයි.

10. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
    I. භාණ්ඩ හා සේවා වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ දී පාරිභෝගික සමාජ තත්ත්වය සැලකිල්ලට ගනු නොලබයි.
    II. ගණකාධිකාරීවරු, ගුරුවරු, වෛද්‍යවරු වැනි මනස වෙහෙසා වැඩ කරන පුද්ගලයෝ ශ්‍රමය යන නිෂ්පාදන සාධකයට අයත් වේ.
    III. සපයන පුද්ගලයා අනුව ස්වභාවය වෙනස්වීම භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණයකි.
    IV. මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා ඉටු කරලීමට, විවිධ දෑ නිෂ්පාදනය කරන ව්‍යාපාර නිෂ්පාදන ව්‍යාපාර යනුවෙන් හඳුන්වයි.